# 5 ගිණුම්කරණ සමීකරණය




මෙම පරිච්ඡේදය මගින් පහත දැක්වෙන කරුණු පිළිබඳ ව සාකච්ඡා කෙරේ.

5.1 ගිණුම්කරණ සමීකරණය

5.2 ගිණුම්කරණ සමීකරණය ගොඩ නැගීම

5.3 ව්‍යාපාර ගනුදෙනු ගිණුම්කරණ සමීකරණයට බලපාන ආකාරය

5.4 හිමිකම වෙනස් වන අවස්ථා

## 5.1 ගිණුම්කරණ සමීකරණය

ව්‍යාපාරයක වත්කම් සහ එම වත්කම්වල හිමිකාරිත්වය ගිණුම් වාර්තාවල පෙන්නුම් කරනු ලැබේ. සියලු වත්කම් කවර හෝ පාර්ශ්වයකට හිමිවිය යුතු ය. එම නිසා වත්කම් ලෙස පෙන්නුම් කරන අගය සහ සමස්ත හිමිකාරිත්වය ලෙස පෙන්නුම් කරන අගය එකිනෙකට සමාන වේ. මෙම සමානතාව පෙන්නුම් කිරීමට සමීකරණයක් භාවිත කෙරන අතර එය ගිණුම්කරණ සමීකරණය ලෙස හඳුන්වනු ලැබේ.

## 5.2 ගිණුම්කරණ සමීකරණය ගොඩ නැගීම

යම් ව්‍යාපාරයකට අවශ්‍ය වන සම්පත් සියල්ල අයිතිකරු සපයා ඇති විටෙක ගිණුම්කරණ සමීකරණය පහත පරිදි දැක්විය හැකි ය.

**වත්කම් = හිමිකම**

**නිදසුන :-**

අමල් රු. 500 000ක් යොදා ව්‍යාපාරයක් අරඹා කළේ ය. මෙහි දී ව්‍යාපාරයට රු. 500 000ක වත්කමක් (මුදල්) ලැබෙන අතර එම සම්පූර්ණ ප්‍රමාණය ම හිමිවන්නේ ව්‍යාපාරයේ අයිතිකරු වන අමල්ට ය.

ඒ අනුව,

| වත්කම් | = | හිමිකම |
|---|---|---|
| රු. | | රු. |
| මුදල් 500 000 | = | ප්‍රාග්ධනය 500 000 |

ව්‍යාපාරයක් ප්‍රසාරණය වන විට අයිතිකරුවන් යොදවනු ලබන සම්පත් පමණක් ප්‍රමාණවත් නොවිය හැකි ය. එහි දී ව්‍යාපාරයකට බාහිර පාර්ශ්ව සතු සම්පත් ද දායක කර ගැනීමට සිදු වේ. එය සිදු කරන්නේ ණය ගැනීම මගිනි. එවිට වගකීම් ඇති වේ. එසේ වගකීම් පවතින විට ව්‍යාපාරයේ වත්කම්වලින් කොටසක් ණය සැපයූ අයට අයත් වේ. ඉතිරි කොටස අයත් වන්නේ අයිතිකරුවන්ට ය.

ඒ අනුව, ගිණුම්කරණ සමීකරණය පහත සඳහන් පරිදි ගොඩනගා ගත හැකි ය.

**වත්කම් = හිමිකම + වගකීම**

**නිදසුන් :-**

ඉහත සඳහන් කරණු ලැබූ අමල්ගේ ව්‍යාපාරය රු. 300 000ක බැංකු ණයක් ලබාගත්තේ නම් ව්‍යාපාරයේ පැවති වත්කම් (මුදල්) රු. 300 000කින් වැඩි වන අතර ව්‍යාපාරය විසින් බාහිර පාර්ශ්වයකට ගෙවිය යුතු රු. 300 000ක වගකීමක් (බැංකු ණය) ඇති වේ.

මේ අනුව දෙවන ව්‍යාපාර ගනුදෙනුව ද ඇතුළත් ව ගිණුම්කරණ සමීකරණය වනුයේ,

| වත්කම් | = | හිමිකම | + | වගකීම |
|---|---|---|---|---|
| රු. | | රු. | | රු. |
| මුදල් 800 000 | = | ප්‍රාග්ධනය 500 000 | + | බැංකු ණය 300 000 |



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

## 5.3 ව්‍යාපාර ගනුදෙනු ගිණුම්කරණ සමීකරණයට බලපාන ආකාරය

ව්‍යාපාර ගනුදෙනු නිසා එම ව්‍යාපාරයෙහි වත්කම්, හිමිකම සහ වගකීම්වල වටිනාකම් වෙනස් වේ. එවිට ඒවා අතර සම්බන්ධතා ව දක්වන ගිණුම්කරණ සමීකරණය ද වෙනස් වේ. මෙම වෙනස් වීම පහත නිදසුන් මගින් අවබෝධ කරගත හැකි ය.

**ගනුදෙනු 1 :-** අයිතිකරු රු. 800 000ක ප්‍රාග්ධනය යෙදවීම
ගිණුම්කරණ සමීකරණය පහත සඳහන් පරිදි වේ.

| වත්කම් | = | හිමිකම | + | වගකීම් |
|---|---|---|---|---|
| රු. | | රු. | | රු. |
| මුදල් 800 000 | = | ප්‍රාග්ධනය 800 000 | + | ____ |

**ගනුදෙනු 2 :-** රු. 100 000ක් වටිනා ලී බඩු මිලදී ගැනීම
ඒ අනුව ගිණුම්කරණ සමීකරණය පහත සඳහන් පරිදි වෙනස් වේ.

| | වත්කම් | | | = | හිමිකම | + | වගකීම් |
|---|---|---|---|---|---|---|---|
| | රු. | | | | රු. | | රු. |
| | ලී බඩු | + | මුදල් | = | ප්‍රාග්ධනය | + | වගකීම් |
| ආරම්භක ශේෂය | ____ | + | 800 000 | = | 800 000 | + | ____ |
| ගනුදෙනුව නිසා වන වෙනස | 100 000 | | (100 000) | = | ____ | + | ____ |
| සමීකරණය | 100 000 | + | 700 000 | = | 800 000 | + | ____ |

**ගනුදෙනු 3 :-** රු. 300 000 ක බැංකු ණයක් ලබා ගැනීම
ඒ අනුව ගිණුම්කරණ සමීකරණය පහත සඳහන් පරිදි වෙනස් වේ.

| | වත්කම් | | | = | හිමිකම | + | වගකීම් |
|---|---|---|---|---|---|---|---|
| | රු. | | | | රු. | | රු. |
| | ලී බඩු | + | මුදල් | = | ප්‍රාග්ධනය | + | බැංකු ණය |
| ආරම්භක ශේෂය | 100 000 | + | 700 000 | = | 800 000 | + | ____ |
| ගනුදෙනුව නිසා වන වෙනස | | | 300 000 | = | ____ | | 300 000 |
| සමීකරණය | 100 000 | + | 1 000 000 | = | 800 000 | + | 300 000 |

**නිදසුන් :-**

නෙහාරා විසින් ආරම්භ කරනු ලැබූ පරිගණක යන්ත්‍ර අලුත්වැඩියා කිරීමේ ව්‍යාපාරයේ පළමු මාසයට අදාළ ව පහත ගනුදෙනු ඔබට සපයා ඇත.

1. රු. 500 000ක ප්‍රාග්ධනයක් යෙදවීම
2. රු. 200 000ක බැංකු ණයක් ලබා ගැනීම
3. රු. 100 000ක් ස්ථාවර තැන්පත් ගිණුමක ආයෝජනය කිරීම
4. පරිගණක අලුත්වැඩියාවෙන් රු. 60 000ක ආදායමක් ලැබීම
5. ව්‍යාපාරයේ මාසික කුලිය ලෙස රු. 10 000ක් ගෙවීම
6. තම පෞද්ගලික කටයුතු සඳහා නෙහාරා රු. 20 000ක් ව්‍යාපාරයෙන් ලබා ගැනීම
7. රු. 100 000ක් ගෙවා උපකරණ ලබා ගැනීම
8. රු. 5 000ක් වූ මාසික දුරකථන බිල ගෙවීම
9. නෙහාරා රු. 50 000ක අමතර ප්‍රාග්ධනයක් යෙදවීම
10. රු. 20 000ක් බැංකු ණය පියවීම

ඉහත සඳහන් ගනුදෙනු ගිණුම්කරණ සමීකරණයට බලපාන ආකාරය පහත දක්වා ඇත.

| අංකය | වත්කම් රු. | | | = හිමිකම් + වගකීම් රු. | |
|---|---|---|---|---|---|
| | උපකරණ | ස්ථාවර තැන්පතු | මුදල් | හිමිකම | බැංකු ණය |
| 1. | | | + 500 000 | + 500 000 | |
| 2. | | | + 200 000 | | + 200 000 |
| 3. | | + 100 000 | - 100 000 | | |
| 4. | | | + 60 000 | + 60 000 | |
| 5. | | | - 10 000 | - 10 000 | |
| 6. | | | - 20 000 | - 20 000 | |
| 7. | + 100 000 | | - 100 000 | | |
| 8. | | | - 5 000 | - 5 000 | |
| 9. | | | + 50 000 | + 50 000 | |
| 10. | | | - 20 000 | | - 20 000 |
| අවසාන ශේෂ | 100 000 | + 100 000 | + 555 000 = | 575 000 | + 180 000 |



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

**නිදසුන් :-**

සඳමිණිගේ ව්‍යාපාරයේ 20XX.08.01 දිනට පහත සඳහන් ශේෂ දක්නට ලැබිණි.

| | | |
|---|---|---|
| වත්කම් :- | | රු. |
| | ලී බඩු උපකරණ | 300 000 |
| | භාණ්ඩ තොගය | 200 000 |
| | ණය ගැතියෝ | 100 000 |
| | මුදල් | 200 000 |
| වගකීම් :- | | |
| | බැංකු ණය | 300 000 |
| | ණය හිමියෝ | 100 000 |

20XX අගෝස්තු මාසයේ පළමු සතිය තුළ පහත ගනුදෙනු සිදු විය.

1. විකිණීම සඳහා රු. 100 000 වටිනා භාණ්ඩ තොගයක් මිලදී ගැනීම
2. රු. 100 000 කට මිලට ගත් භාණ්ඩ තොගයක් රු. 125 000 කට අත්පිට මුදලට විකිණීම
3. බැංකු ණයෙන් රු. 50 000ක් පියවීම
4. වැටුප් සඳහා රු. 10 000ක් ගෙවීම
5. ව්‍යාපාරයේ විකිණීමට ඇති භාණ්ඩවලින් රු. 20 000ක් පිරිවැය වූ භාණ්ඩ සඳමිණි තම පෞද්ගලික පරිභෝජනය සඳහා ගැනීම
6. රු. 50 000ක් වටිනා ලී බඩු කාර්යාලයේ ප්‍රයෝජනය සඳහා මිලදී ගැනීම
7. විකිණීම සඳහා රු. 200 000ක් වටිනා භාණ්ඩ ණය පදනම මත මිලදී ගැනීම
8. රු. 60 000කට මිලට ගත් භාණ්ඩ තොගයක් රු. 100 000කට ණයට විකිණීම
9. රු. 80 000ක් ණය ගැතියන්ගෙන් ලැබීම
10. රු. 50 000ක් ණය හිමියන්ට ගෙවීම

20XX.08.01 දිනට අයිතිකරුගේ හිමිකම ගණනය කරන ආකාරයත් ඉහත දක්වා ඇති ගනුදෙනු ගිණුම්කරණ සමීකරණයට බලපාන ආකාරයත් පහත දැක්වේ.

**20xx.08.01 දිනට අයිතිකරුගේ හිමිකම ගණනය කරන ආකාරය**

හිමිකම = මුළු වත්කම් - වගකීම්
= (200 000 + 100 000 + 200 000 + 300 000) - (300 000 + 100 000)
= රු. 800 000 - රු. 400 000
= රු. 400 000

ගනුදෙනු ගිණුම්කරණ සමීකරණයට බලපාන ආකාරය

| | වත්කම් රු. | | | | = හිමිකම් + වගකීම් රු. | | |
|---|---|---|---|---|---|---|---|
| | ලී බඩු උපකරණ | + භාණ්ඩ තොගය | + ණය ගැතියෝ | + මුදල් | හිමිකම් | + බැංකු ණය | + ණය හිමියෝ |
| ආරම්භක ශේෂ | 300 000 | +200 000 | +100 000 | +200 000 | +400 000 | +300 000 | +100 000 |
| 1. | | +100 000 | | -100 000 | | | |
| 2. | | -100 000 | | +125 000 | +25 000 | | |
| 3. | | | | -50 000 | | -50 000 | |
| 4. | | | | -10 000 | -10 000 | | |
| 5. | | -20 000 | | | -20 000 | | |
| 6. | +50 000 | | | -50 000 | | | |
| 7. | | +200 000 | | | | | +200 000 |
| 8. | | -60 000 | +100 000 | | +40 000 | | |
| 9. | | | -80 000 | +80 000 | | | |
| 10. | | | | -50 000 | | | -50 000 |
| අවසාන ශේෂ | 350 000 | +320 000 | +120 000 | +145 000 = | 435 000 | +250 000 | +250 000 |

**නිදසුන් :-**

රුවන්තිගේ ව්‍යාපාරයේ 20xx ජූලි 01 දින පහත ශේෂ දක්නට ලැබුණි.

| | රු. |
|---|---|
| මෝටර් රථ | 500 000 |
| භාණ්ඩ තොග | 200 000 |
| මුදල් | 100 000 |
| බැංකු ණය | 200 000 |
| ණය හිමියෝ | 100 000 |
| ප්‍රාග්ධනය | 500 000 |



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

ජූලි මාසය තුළ සිදු වූ ගනුදෙනු පහත දක්වා ඇත.

1. අයිතිකරු විසින් අමතර ප්‍රාග්ධනය ලෙස රු. 200 000ක් යෙදවීම
2. රු. 2 000ක පොලී ඇතුළත් ව බැංකු ණය වාරිකය වූ රු. 20 000 ගෙවීම
3. රු. 100 000ක භාණ්ඩ තොගයක් ණය පදනම මත මිලදී ගැනීම
4. ණය හිමියන්ට රු. 50 000ක් ගෙවීම
5. රු. 200 000ක් වටිනා අයිතිකරුගේ පෞද්ගලික යතුරුපැදිය ව්‍යාපාරයට යෙදවීම
6. රු. 100 000ක් පිරිවැය වූ භාණ්ඩ තොගයක් රු. 150 000කට ණයට විකිණීම
7. රක්ෂණ ගාස්තු සඳහා රු. 10 000ක් ගෙවීම
8. ණය ගැතියන්ගෙන් රු. 70 000ක් ලැබීම
9. රු. 5000ක් වූ අයිතිකරුගේ නිවසේ විදුලි බිල ව්‍යාපාරයේ මුදලින් පියවීම
10. විකුණුම් කොමිස් ආදායම ලෙස රු. 10 000ක් ලැබීම

ඉහත ගනුදෙනු ගිණුම්කරණ සමීකරණයට බලපාන ආකාරය පහත දක්වා ඇත.

| | වත්කම් රු. | | | | = හිමිකම් + වගකීම් රු. | | |
|---|---|---|---|---|---|---|---|
| | මෝටර් රථ | + භාණ්ඩ තොගය | + ණය ගැතියෝ | + මුදල් | හිමිකම | + බැංකු ණය | + ණය හිමියෝ |
| ආරම්භක ශේෂ | 500 000 | +200 000 | | 100 000 | 500 000 | 200 000 | 100 000 |
| 1. | | | | +200 000 | +200 000 | | |
| 2. | | | | -20 000 | -2 000 | -18 000 | |
| 3. | | +100 000 | | | | | +100 000 |
| 4. | | | | -50 000 | | | -50 000 |
| 5. | +200 000 | | | | +200 000 | | |
| 6. | | -100 000 | +150 000 | | +50 000 | | |
| 7. | | | | -10 000 | -10 000 | | |
| 8. | | | -70 000 | +70 000 | | | |
| 9. | | | | -5 000 | -5 000 | | |
| 10. | | | | +10 000 | +10 000 | | |
| අවසාන ශේෂ | 700 000 | +200 000 | +80 000 | +295 000 = | 943 000 | +182 000 | +150 000 |



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

ව්‍යාපාරයක සිදුවී ඇති ගනුදෙනුවල බලපෑම ගිණුම්කරණ සමීකරණ ඇසුරෙන් ඉදිරිපත් කර ඇති විටෙක දී ඒ ඒ අවස්ථාවේ දී සිදු වී ඇති ගනුදෙනුව කුමක් ද යන්න හඳුනා ගැනීම ද වැදගත් වේ.

පහත දැක්වෙන නිදසුන අධ්‍යයනය කරන්න.

**නිදසුන් :-**

ආලෝකගේ ව්‍යාපාරයේ ජනවාරි මාසය තුළදී සිදු වී ඇති ගනුදෙනුවලින් ගිණුම්කරණ සමීකරණයට වූ බලපෑම පහත පරිදි දක්වා ඇත.

| | වත්කම් රු. | | | | = හිමිකම් + වගකීම් රු. | | |
|---|---|---|---|---|---|---|---|
| | ඉඩම් හා ගොඩනැගිලි | + භාණ්ඩ තොගය | + ණය ගැතියෝ | + මුදල් | හිමිකම | + බැංකු ණය | + ණය හිමියෝ |
| ජනවාරි 01 ශේෂය | 1000 000 | 300 000 | 200 000 | 300 000 | 1200 000 | 500 000 | 100 000 |
| 01.03 | | +200 000 | | -100 000 | | | +100 000 |
| 01.07 | | | | -20 000 | -20 000 | | |
| 01.10 | | | | -60 000 | -10 000 | -50 000 | |
| 01.14 | | -200 000 | +300 000 | | +100 000 | | |
| 01.18 | | | | +300 000 | +300 000 | | |
| 01.21 | | | | -100 000 | | | -100 000 |
| 01.25 | | | -400 000 | +400 000 | | | |

මෙම ව්‍යාපාරයේ අයිතිකරු මාසය තුළ දී ගැනිලි සිදුකර නැත.

ඒ ඒ දිනයන්හි සිදු වී ඇතැයි උපකල්පනය කළ හැකි ගනුදෙනු වටිනාකම් සහිත ව පහත දැක්වෙන අයුරින් ඉදිරිපත් කළ හැකි ය.

| | |
|---|---|
| ජන. 03 | රු. 100 000ක් වටිනා භාණ්ඩ අත්පිට මුදලට ද රු. 100 000 ක් වටිනා භාණ්ඩ ණය පදනම මත ද ගැනීම |
| ජන. 07 | රු. 20 000ක් වූ ව්‍යාපාරයේ වියදමක් මුදලින් ගෙවීම |
| ජන. 10 | රු. 10 000ක පොලිය ද ඇතුළත් ව බැංකු ණය වාරිකය ලෙස රු. 60 000ක් ගෙවීම. |
| ජන. 14 | රු. 200 000කට මිලදී ගත් භාණ්ඩ 300 000කට ණයට විකිණීම |
| ජන. 18 | රු. 300 000ක් අමතර ප්‍රාග්ධනය ලෙස යෙදවීම |
| ජන. 21 | රු. 100 000ක් ණය හිමියන්ට ගෙවීම |
| ජන. 25 | රු. 400 000ක් ණය ගැතියන්ගෙන් ලැබීම |



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

## හිමිකම වෙනස්වන අවස්ථා

ඉහත දක්වන ලද කරුණු අධ්‍යයනය කිරීමෙන් ඔබ ව්‍යාපාරය අයිතිකරුගේ හිමිකම අඩු වැඩි වීමට බලපාන ගනුදෙනු හඳුනා ගන්නට ඇත. ව්‍යාපාරයක හිමිකම වෙනස් වීමට පහත සඳහන් ගනුදෙනු බලපායි.

- අමතර ප්‍රාග්ධනය යෙදීම
- ගැනිලි
- අදයම්
- වියදම්

ව්‍යාපාරය කරගෙන යන අතරතුර දී ව්‍යාපාරයේ අවශ්‍යතාව අනුව මුදල් හෝ වෙනත් වත්කම් අයිතිකරු විසින් යෙදවිය හැකි ය. මෙය හිමිකම වැඩි වීමට බලපායි.

ව්‍යාපාරයේ හිමිකරු විසින් තම පෞද්ගලික ප්‍රයෝජනය සඳහා ව්‍යාපාරයෙන් මුදල් හෝ වෙනත් වත්කම් ඉවත් කර ගත හැකි ය. මේවා ගැනිලි වශයෙන් හඳුන්වන අතර මේ මගින් අයිතිකරුගේ හිමිකම අඩු වේ.

ව්‍යාපාරයට අදයම් ලැබීම හිමිකම වැඩි වීමට බලපාන අතර වියදම් හිමිකම අඩු වීමට බලපායි.

**නිදසුන් ඃ-**

බිනුරිගේ ව්‍යාපාරයේ 20xx වර්ෂය සඳහා තොරතුරු කිහිපයක් පහත දක්වේ.

| | රු. |
|---|---|
| ප්‍රාග්ධනය (20xx.01.01 දිනට) | 358 500 |
| වර්ෂයේ වියදම් | 128 300 |
| වර්ෂයේ ආදයම් | 254 620 |
| ජූනි 30 දින අයිතිකරු යෙදවූ මුදල් | 75 000 |

20xx දෙසැම්බර් 31 දිනට අයිතිකරුගේ හිමිකම ගණනය කරන අකාරය පහත දක්වේ.

| | | | රු. |
|---|---|---|---|
| | ප්‍රාග්ධනය | 20xx.01.01 | 358 500 |
| + | ආදයම් | | 254 620 |
| | අතිරේක ප්‍රාග්ධනය යෙදවීම | | 75 000 |
| | | | 688 120 |
| − | වියදම් | | (128 300) |
| | 20xx1231 දිනට හිමිකම | | 559 820 |



## ක්‍රියාකාරකම 01

ජයන්තගේ ව්‍යාපාරයේ අප්‍රේල් මාසයේ සිදු වූ ගනුදෙනු ගිණුම්කරණ සමීකරණයට බලපා ඇති ආකාරය පහත දක්වේ.

| | වත්කම් රු. | | | = | හිමිකම + වගකීම් රු. | |
|---|---|---|---|---|---|---|
| | මෝටර් රථ | + භාණ්ඩ තොගය | + ණය ගැතියෝ | + මුදල් | හිමිකම | + ණය හිමියෝ |
| 4.1 දිනට ශේෂය | 500 000 | +200 000 | | +200 000 | +700 000 | +200 000 |
| 04.03 | | | | +300 000 | +300 000 | |
| 04.05 | | +100 000 | | | | +100 000 |
| 04.08 | | | | -50 000 | | -50 000 |
| 04.10 | | | | -10 000 | -10 000 | |
| 04.11 | | -60 000 | +100 000 | | +40 000 | |
| 04.17 | +200 000 | | | | +200 000 | |
| 04.19 | | -20 000 | | | -20 000 | |
| 04.23 | | | -20 000 | +20 000 | | |
| 04.28 | | -5 000 | | | -5 000 | |
| 04.30 | | | | | +50 000 | -50 000 |
| අවසාන ශේෂ | 700 000 | 215 000 | 80 000 | 460 000 | 1255 000 | 200 000 |

මාසය තුළදී අයිතිකරු මුදල් ගැනිලි කිසිවක් සිදු කර නැත.

අවශ්‍ය වන්නේ :-

එක් එක් දිනයේ සිදුවී ඇති ගනුදෙනුව අගයන් සහිත ව දක්වීම



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

## ක්‍රියාකාරකම 02

පහත දැක්වෙන්නේ තිසුරිගේ ව්‍යාපාරයේ ජනවාරි මාසයට අදාළ ගනුදෙනු ය.

ජනවාරි 01. රු. 300 000ක ප්‍රාග්ධනයක් යෙදවීම

04. රු. 50 000ක් පිරිවැය වූ භාණ්ඩ මිලට ගැනීම

09. මාසික කඩ කුලී ලෙස රු. 10 000ක් ගෙවීම

13. රු. 40 000ක භාණ්ඩ තොගයක් රු. 60 000කට විකිණීම

19. රු. 300 000 බැංකු ණයක් ලබා ගැනීම

21. තිසුරිගේ නිවසේ දුරකථන බිල රු. 10 000ක් ව්‍යාපාරයේ මුදලින් ගෙවීම

28. ණය ගැතියන්ගෙන් රු. 30 000ක් ලැබීම

30. බැංකු ණය සඳහා වූ මාසික පොලිය ලෙස රු. 5000ක් ගෙවීම

31. ව්‍යාපාරයේ විදුලි බිල සඳහා රු. 5000ක් ගෙවීම

අවශ්‍ය වන්නේ :-

ඉහත එකිනෙක ගනුදෙනුවලින් ගිණුම්කරණ සමීකරණයට වන බලපෑම වටිනාකම් සහිත ව දැක්වීම

## ක්‍රියාකාරකම 03

ජීවන්තගේ ව්‍යාපාරයේ 20xx වර්ෂය සඳහා තොරතුරු කිහිපයක් පහත දැක්වේ.

| | රු. |
|---|---|
| ප්‍රාග්ධනය (20xx.01.01 දිනට) | 415 000 |
| වර්ෂයේ ආදායම් | 210 300 |
| වර්ෂයේ වියදම් | 122 000 |
| වර්ෂය තුළ අයිතිකරු යෙද වූ මුදල් | 50 000 |

අවශ්‍ය වන්නේ :-

20xx දෙසැම්බර් 31 දිනට අයිතිකරුගේ හිමිකම ගණනය කිරීම



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

## ක්‍රියාකාරකම 04

ව්‍යාපාරයක සිදු වූ ගනුදෙනු කිහිපයක බලපෑම ගිණුම්කරණ සමීකරණ අනුසාරයෙන් පහත පරිදි දක්වා ඇත.

| දිනය | වත්කම් | = | හිමිකම | + | වගකීම |
|---|---|---|---|---|---|
| ජූනි 1 | වැඩිවීම<br>අඩුවීම | | | | |
| ජූනි 2 | අඩුවීම | = | අඩුවීම | | |
| ජූනි 3 | වැඩිවීම | = | | | වැඩිවීම |
| ජූනි 4 | වැඩිවීම | = | වැඩිවීම | | |
| ජූනි 5 | අඩුවීම | = | | | අඩුවීම |

මෙම සමීකරණයට අනුව එක් එක් දින සිදුවුයේ යැයි අපේක්ෂා කළ හැකි ගනුදෙනු දෙක බැගින් වටිනාකම් සහිත ව දක්වන්න.



නොමිලේ බෙදා හැරීම සඳහා ය.